# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1192/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 19/07/2024 පැය 1900

**මාධ්‍ය නිවේදනය**

**ඇසළ පුන් පොහෝ දිනයට සමගාමීව පැවැත්වෙන බෞද්ධාගමික වැඩසටහන් වෙනුවෙන් විධිමත් ආරක්ෂක හා රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

ඇසළ පුන් පොහෝ දිනය 2024.07.20 වන දිනට යෙදී ඇත. එයට සමගාමීව බෞද්ධ ආගමික වතාවත් සිදු කිරීම, පෙරහර පැවැත්වීම ඇතුළු විවිධ ආගමික උත්සව මෙම සතිය තුළ පැවැත්වෙන අතර, ඒ සඳහා බැතිමතුන් විශාල වශයෙන් සහභාගී වීම අපේක්ෂා කරනු ලබයි.

එබැවින් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය දිවයිනේ සෑම පොලිස් බල ප්‍රදේශයකම ඇසළ පෝය නිමිති කර ගෙන පැවැත්වෙන ආගමික කටයුතු හා සංස්කෘතික උත්සව අවස්ථාවන් වෙනුවෙන් විධිමත් ආරක්ෂක හා රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කල යුතු බවට පොලිස්පතිතුමා විසින් සියළුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර නිලධාරීන් ඇතුළු සියළුම පොලිස් නිලධාරීන් වෙත දන්වා ඇත.

ඒ අනුව,

- මහජනතාව වැඩි වශයෙන් පැමිණීම සිදු විය හැකි බෞද්ධ විහාරස්ථාන ඇතුළු ආගමික ස්ථාන හා පෙරහර ගමන් මාර්ග ආදිය හඳුනාගෙන ඒවායෙහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඊට අදාල ආගමික නායකයින් හා සංවිධායකයින් සමඟ සාකච්ඡා කර නිසි පරිදි ක්‍රියා කිරීමට උපදෙස් ලබා දී ඇත.

- සෑම පොලිස් වසමකම දිවා රාත්‍රී ක්‍රියාත්මක වන පරිදි ජංගම සංචාර, පාමුර සංචාර, පාපැදි, බීට්ටු සහ යතුරුපැදි සංචාර ක්‍රියාත්මක කර මංසන්ධි හා නාගරික ප්‍රදේශවල රථවාහන තදබදයක් නිර්මාණය වීම වැලක්වීම සඳහා නිලධාරීන් යෙදවීමට හා ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින්ගේ සහාය ආරක්ෂක රාජකාරි සඳහා ලබා ගැනීමටත් ක්‍රියා කරනු ලබයි.

- බුද්ධි නිලධරයන් ආවේක්ෂණ රාජකාරි සඳහා යොදවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී පොලිස් විශේෂ කාර්ය බලකා සහ ත්‍රිවිධ හමුදා සහාය ලබා ගැනීම සඳහා ද සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කර ඇත.

- මාර්ග රිය අනතුරුවලට තුඩු දෙන බීමත්ව රිය පැදවීම, අධික වේගයෙන් රිය ධාවනය, අපරික්ෂාකාරී සහ අන්තරාදායක ලෙස රිය පැදවීම යන වැරදි සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර රිය අනතුරු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට ද දැනුවත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**